කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ දීමනා.

111ඊ. පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලබන යම් දීමනාවක් කොමිෂන් සභාවේ සාමාජිකයකුට ගෙවනු ලැබිය යුත්තේ ය. ඒ දීමනාව ඒකාබද්ධ අරමුදලට වැයබරක් වන අතර සාමාජිකයාගේ ධුර කාලය තුළ දී අඩු නොකළ යුත්තේ ය. තව ද එම දීමනාව ඒ සාමාජිකයාගේ ස්ථිර තනතුරට අයත් වූ හා ඒ තනතුරෙන් ලබන්නා වූ වැටුපට සහ වෙනත් දීමනාවලට අමතරව විය යුත්තේ ය :

එසේ වුව ද දීමනා වශයෙන් ගෙවිය යුතු මුදල් ප්‍රමාණය මේ ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ නිශ්චය කරනු ලබන තෙක් මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී කොමිෂන් සභාවේ සාමාජිකයන් විසින් ලබන ලද මුදල් ප්‍රමාණය ඔවුන්ට දීමනා වශයෙන් තවදුරටත් ලැබිය යුත්තේ ය.

කොමිෂන් සභාවේ ලේකම්වරයා.

111උ. කොමිෂන් සභාවට මුල් අවස්ථා අධිකරණවල ජ්‍යෙෂ්ඨ අධිකරණ නිලධරයන් අතුරෙන් කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය යුතු ලේකම්වරයෙක් සිටිය යුත්තේ ය.

කොමිෂන් සභාවේ බලතල.

111ඌ. (1) අධිකරණ සේවා කොමිෂන් සභාවට–

(අ) මහාධිකරණ විනිශ්චයකාරවරයන්ගේ ස්ථාන මාරු කිරීමේ බලය ;

(ආ) අධිකරණ නිලධරයන් සහ උපලේඛනගත රජයේ නිල්ධරයන් පත් කිරීමේ, උසස් කිරීමේ, ස්ථාන මාරු කිරීමේ, සේවයෙන් පහ කිරීමේ හා ඔවුන් විෂයෙහි විනය පාලනය ක්‍රියාවේ යෙදීමේ බලය

මෙයින් පැවරෙන්නේ ය.

(2) කොමිෂන් සභාව විසින්–

(අ) මහාධිකරණයේ විනිශ්චයකාරවරයන් පුහුණු කිරීම සම්බන්ධයෙන් රීති සහ අධිකරණ නිලධරයන් සහ උපලේඛනගත රජයේ නිලධරයන් බඳවා ගැනීම, පුහුණු කිරීම, පත් කිරීම, උසස් කිරීම සහ ස්ථාන මාරු කිරීම සම්බන්ධයෙන් පටිපාටි සාදනු ලැබිය හැක්කේ ය ;

(ආ) කොමිෂන් සභාවේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාවේ යෙදීම හා ඉටු කිරීම සඳහා අවශ්‍ය හෝ අවස්ථාවෝචිත කාරණ සඳහා විධිවිධාන සලස්වනු ලැබිය හැක්කේ ය.

(3) යම් මුල් අවස්ථා අධිකරණයක් හෝ මුල් අවස්ථා අධිකරණයක පවත්වා ගෙන යනු ලබන වාර්තා, රෙජිස්ටර හෝ වෙනත් ලේඛන පරීක්ෂා කිරීමේ සහ අවශ්‍ය වන යම් පරීක්ෂණයක් පැවැත්වීමේ බලය සහ අධිකාරය, අවස්ථාවෝචිත පරිදි කොමිෂන් සභාවේ සභාපතිවරයාට හෝ කොමිෂන් සභාව විසින් බලය දෙනු ලැබූ, ශ්‍රේෂ්ඨාධිකරණයේ යම් විනිශ්චයකාරවරයකුට හෝ අභියාචනාධිකරණයේ යම් විනිශ්චයකාරවරයකුට හෝ තිබිය යුත්තේ ය.

(4) උපලේඛනගත රජයේ නිලධරයන් සම්බන්ධයෙන් වැටුප් වැඩිවීමක් සහිත මාරුවීමක් නොවන සියලු මාරුවීම් කිරීමේ බලය හෝ නියමයේ නිශ්චිතව සඳහන් අවස්ථාවන්හි දී සහ සීමා කිරීම්වලට යටත්ව, වැඩ බැලීමේ, පත්වීම් කිරීමේ බලය කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයකින් කොමිෂන් සභාවේ ලේකම්වරයාට පවරනු ලැබිය හැක්කේ ය.

අධිකරණ නිලධරයකුට හෝ උපලේඛනගත රජයේ නිලධරයකුට ඉල්ලා අස්විය හැකි බව.

111ඒ. යම් අධිකරණ නිලධරයකුට හෝ උපලේඛනගත රජයේ නිලධරයකුට කොමිෂන් සභාවේ සභාපතිවරයා අමතා ස්වකීය අත්සනින් යවනු ලබන ලිපියක් මගින් ධුරයෙන් ඉල්ලා අස්විය හැක්කේ ය.

නඩු කටයුතුවලින් මුක්ත බව.

111ඒ. කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් හෝ කොමිෂන් සභාවේ සාමාජිකයකු හෝ ලේකම්වරයා හෝ නිලධරයකු විසින් ඒ සභාපතිවරයා, සාමාජිකයා, ලේකම්වරයා හෝ කොමිෂන් සභාවේ නිලධරයා වශයෙන් ස්වකීය කාර්ය හෝ කර්තව්‍ය ඉටු කිරීමෙහි ලා සද්භාවයෙන් කරන ලද යම් නීත්‍යානුකූල ක්‍රියාවක් හේතුකොට ගෙන ඔහුට විරුද්ධව කිසිදු සිවිල් නඩුවක් හෝ නඩු කටයුත්තක් පවරනු නොලැබිය යුත්තේ ය.

කොමිෂන් සභාවේ කටයුතුවලට අයුතු ලෙස මැදිහත් වීම වරදක් බව.

111ඔ. (1) ස්වකීය නීත්‍යානුකූල කාර්ය ඉටු කිරීමේලා හැර කෙළින්ම හෝ අන්‍යාකාරයකින් තමන් විසින් ම හෝ වෙනත් තැනැත්තකු මාර්ගයෙන් හෝ වෙනත් තැනැත්තකු සමග, කවර හෝ ආකාරයකින් කොමිෂන් සභාව විසින් දෙනු ලබන තීරණයකට හෝ නියමයකට බලපෑමක් කරන හෝ බලපෑමක් කිරීමට තැත් කරන හෝ කොමිෂන් සභාවේ සාමාජිකයකුට ඒ ආකාරයෙන් බලපෑමක් කරන සෑම තැනැත්තෙක් ම වරදක් කරන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු තුනක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඒ තැනැත්තා යටත් වන්නේ ය :

එසේ වුවද යම් අධිකරණ ධුරයක් හෝ උපලේඛනගත රජයේ තනතුරක් ඉල්ලුම් කරන ඉල්ලුම්කරුවකුට හෝ අපේක්ෂකයකුට සහතිකයක් හෝ චරිත සහතිකයක් දීම වරදක් නොවන්නේ ය.

(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද සෑම මහාධිකරණයකට ම මේ ව්‍යවස්ථාවේ (1) වන ඡේදයේ සඳහන් කවර හෝ කාරණයක් විභාග කොට තීරණය කිරීමට අධිකරණ බලය ඇත්තේ ය.

අර්ථ නිරූපණය.

111ඕ. (අ) මේ පරිච්ඡේදයෙහි –

"පත් කිරීම" යන්නට මේ පරිච්ඡේදයෙහි සඳහන් කවර හෝ ධුරයක වැඩ බැලීම සඳහා වූ පත් කිරීමක් ඇතුළත් වේ ;